කමක්. මැන්ඩෙලා අපිව එක්සත් කළා. කලු* සුදු* වර්ණවත්* ඉන්දියානු* මේ හැමෝවම. ඔහු අපිට එකමුතුබව ඉගැන්වූවා"

"ඔහු සොවේටෝවලට ආවෙ නීතිඥයෙක් විදිහට. ඔහු අපිව මෙහෙයෙවුවා. 1994, අවුරුදු 27 කට පස්සෙ ඔහු හිරෙන් එළියට ආවෙ වෛරයෙ තිත්ත සමග නෙවෙයි. ඔහු ආවෙ සාමයේ පණිවුඩයත් එක්ක." 37 හැවිරිදි සොවේටෝ වැසියෙකු වන ම්බුලේලෝ රඩ්බි ප්‍රකාශ කළා.

ජොහැන්නස්බර්ග් නගරයේ නෙල්සන් මැන්ඩෙලා චතුරශ්‍රයේ ඇති මීටර් හයක් උස මැන්ඩෙලා පිළිරුව අසල සිටගත් පුරවැසියන් හය දෙනෙකු සිය නායකයාට ප්‍රණාමය දැක්වූවා. සුදු ජාතිකයින් දෙදෙනෙක්, කලු ජාතිකයින් දෙදෙනෙක් සහ ඉන්දියානුවන්ගෙන් පැවත එන්නන් දෙදෙනෙකු වශයෙන්. එයින් නියෝජනය කළේ මැන්ඩෙලා සිය ජීවිතය සහ නිදහස පරිත්‍යාග කරමින් සටන් කොට දිනාගත් දකුණු අප්‍රිකාවේ දේදුණු ජාතිකත්වය (Rainbow Nation) සංකේතවත් කරමින්.

"අවුරුදු 23ක්* ඔහු නිදහස් වූ දා සිට* මා ඔහුගේ මාවතේ ගමන් කළා." වෙළඳ සේවිකාවක් වන 46 හැවිරිදි සොන්ජා පෝකොක් කීවා. "මම අයත් වෙන්නේ පැරණි

මැදියම් රාත්‍රියේ මෙහෙම කිව්වා.

"මම ඔහුව අගය කළා. ඔහු නිදහස සහ සමානාත්මතාවය වෙනුවෙන් පෙනී සිටියා. සමහරු කියනවා ඔහු ත්‍රස්තවාදියෙක් කියලා. නමුත් ඔහු නැගී සිටියේ ඔහු විශ්වාස කළ දෙය වෙනුවෙන්. ඔබ කලු වුනත් සුදු වුනත් දුප්පත් වුනත් පෝසත් වුනත්* හැමදෙනාටම අයිතියක් තියෙනවා ජීවත් වෙන්න. ඒ වෙනුවෙනුයි ඔහු නැගී සිටියෙ. ඒ වගේම ඔහු සමාව දීම වෙනුවෙනුත් පෙනී සිටියා. එයයි ඔහුගෙ විශේෂත්වය...("

"ඔහු සිය ක්‍රියාවෙන් එනම් සිය උණුසුම් බවින්, අනෙකාව හඟින්නට සහ අනෙකාට සවන් දෙන්නට තිබූ වුවමනාව නිසාම ඔහු ජාතිය සහ පංතිය ඉක්මවා ගියා. ඔහු අපිට ඉගැන්වූවා දේශපාලනිකව, සාමාජයීය වශයෙන් හෝ සංස්කෘතිකව වෙනස්වන්නන් ට ගරු කිරීම යනු දුර්වලකමේ සංකේතයක් නොව ස්වාභිමානයේ සංකේතයක් බව." වරක් ඩෙස්මන්ඩ් ටුටු ආච්බිෂොප්වරයා ප්‍රකාශ කර තිබුණා.

"ලෝකය වෙනස් කළ හැකියි. ආකල්ප සහ සංජානනය වෙනස් කිරීම හරහා ලෝකය වෙනස් කළ හැකියි. එය සැබෑවක් කළ මේ උසස් මිනිසාට මම මගේ ප්‍රණාමය පුදකරනවා." අවුං සාං සුකී ඔහුගේ මරණින්

*"ලෝකය වෙනස් කළ හැකියි. ආකල්ප සහ සංජානනය වෙනස් කිරීම හරහා ලෝකය වෙනස් කළ හැකියි. එය සැබෑවක් කළ මේ උසස් මිනිසාට මම මගේ ප්‍රණාමය පුදකරනවා." අවුං සාං සුකී ඔහුගේ මරණින් පසු අල්ජසීරා රූපවාහිනී නාලිකාවට පැවසුවා. නාලිකාවට පැවසුවා.*

රෙජීමයට. ඔහු මගේ සීයා වගේ. ඔව්. ඔහු මගේ සීයා තමයි." ඇය එසේ පවසා වැළපෙන්න පටන් ගත්තා.

ඇගේ මිතුරියක වන 38 හැවිරිදි ක්‍රෙසාන් ෂෝමන් මැන්ඩෙලා පිළිරුව අසල රතුමල් අතුරමින් සිටි සිය මිතුරිය දෙස බලාගෙන ඒ

පසු අල්ජසීරා රූපවාහිනී නාලිකාවට පැවසුවා.

මැන්ඩෙලා* අනුර ශ්‍රීනාත්ගේ තෙලි තුඩින් ද

"බමරීරසබ්එය.ජදප

අමෙරිකාව ඇතුළු නවීකරණය වූ

ආක්‍රමණිකයින් සහ වර්ගවාදයන් නිර්මාණය කරන්නන් මැන්ඩෙලාගේ මරණය ගැන ශෝක වන අකාරය එක්තරා විදිහකින් හාස්‍යජනක වන්නා සේම ඔහු වෙනුවෙන් බ්‍රිතාන්‍ය උප අගමැති නික් ක්ලෙග් නිකුත් කළ නිල පණිවුඩය අධිරජ්‍යවාදී උමතුවක ලේ වැකුණු ඉතිහාසයක් මත උත්ප්‍රාසය තවරනවා.

පෞද්ගලික ජීවිතය නොතකා දශක ගණනක් කැපකළ මේ උදාර මිනිසා අවසානයේ දී සිය සිහිනය සැබෑ කරගත්තා. ඊට වඩා විසි ගුණයක් කුඩා, ජනතාව මිලියන 20 ක් වසන ශ්‍රී ලංකාව ඒ සිහිනයෙන් කොතරම් ඈතදැයි සිතන්නට දකුණු අප්‍රිකාවේ මෙන් දශක ගණනක් ඈතට යා යුතු නොවේ. දශක දෙකක් හොඳටම ප්‍රමාණවත්ය.



[Jurgen Schadeberg" Nelson Mandela in his Cell on Robben Island" Revisit 1994]

"ඉතිහාසය විසින් කලාතුරකින් විශ්වීය පණිවුඩ දිය හැකි මිනිසුන් නිර්මාණය කරනවා. නෙල්සන් මැන්ඩෙලා, ඔහු නැති ශෝකය සහ පාළුව හැම මහාද්වීපයකටම සමස්ත ලෝකයටම දැනේවි. ඔහු රැගෙන ආ බලාපොරොත්තුව ජාතීන් එකමුතු කරනු ඇති. එය සංස්කෘතීන් යා කළා. පරම්පරාවන් අභිබවා ගියා. එයට හැකිවුණා ගැඹුරුම බෙදීම් පවා නැති කර දමන්න." අගමැති ඩේවිඩ් කැමරන් ගේ වර්ණභේදවාදී දකුණු අප්‍රිකානු ඉතිහාසය ඒ උත්ප්‍රසාය තවත් තීව්‍ර කරනු ඇති.

වර්ග කිලෝ මීටර 1,221,037ක වසන මිලියන 53 ක ජනතාවක් වර්ගවාදයෙන් සහ වර්ණ භේදවාදයෙන් මුදාගෙන එකමුතු කිරීමට

අධිරාජ්‍යවාදී උත්ප්‍රාසයට එකතු වනවා ද දේදුණු ජාතියක බලාපොරොත්තුවට පණ දෙනවා ද යන්න එක වරක් නොව සිය දහස් වරක් රටක් ලෙස අප සිතා බැලිය යුතුය. මානව හිමිකම් පිළිබඳ නීතිඥයෙකු වෙන ජෝර්ජ් බිසෝස් ENCA රූපවාහිනියට පැවසුවේ සිය දීර්ඝ කාලීන මිත්‍රයකු වූ මැන්ඩෙලා කිසිදිනෙක වර්ගවාදයට එරෙහිවීම සහ ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා කළ කැප කිරීම බිඳකිනුදු අඩු නොකළ බවයි.

"ඔහු ජීවිතයටත් වඩා විශාලයි. ඔහු වැනි කෙනෙක් නැවත අපට මුණ ගැහෙන්නේ නැහැ." බිසෝස් පැවසුවා.

boondi.lk


